4	යෝග	යෝග මාර්ගෝපදේශ අත්පොත	ප්‍රජා සෞඛ්‍ය / මාතෘ හා ළමා පෝෂණ පුහුණු අංශය	400
5	සීමාවාසික වෛද්‍ය පුහුණුව	සීමාවාසික වෛද්‍ය පුහුණුවට අදාළ මාර්ගෝපදේශ අත්පොත	කළමනාකරණ පුහුණු අංශය	400

2.10 ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවය - අනුරාධපුරය

අංක	වැඩසටහන	වැඩසටහන් විස්තරය	වැඩසටහන්
1	**බෝ නොවන රෝග පාලන වැඩසටහන**	ජංගම වෛද්‍ය සායන	127
		රෝගීන් හඳුනාගැනීමේ මූලික පරීක්ෂණ සායන හා වැඩසටහන්	185
		රාජකාරී සේවා ස්ථාන ආශ්‍රිත සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන්	110
		යෝග සහ සංයම අභ්‍යාස මඟින් මානසික සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන්	65
		බෝ නොවන රෝග පාලන දැනුවත් කිරීමේ වැඩසටහන්	2813
2	**බෝ වන රෝග පාලන වැඩසටහන**	බෝවන රෝග පාලනය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන්	2853
3	**ආහාර හා පෝෂණ සුරක්ෂිතතා වැඩසටහන පාසල්/ අනෙකුත්**	ආයුර්වේද පෝෂණ සංකල්ප ප්‍රවර්ධන හා දැනුවත් කිරීමේ වැඩසටහන්	517
		දේශීය ආහාර ප්‍රචලිත කිරීම ප්‍රායෝගික වැඩසටහන්	406
4	**ළමා සෞඛ්‍ය සංරක්ෂණය - පෙරපාසල්**	පෙරපාසල් දරුවන්ගේ සෞඛ්‍ය තත්ත්වය මැන බැලීම හා සෞඛ්‍ය සංරක්ෂණ වැඩසටහන්	652
		ළමා සායන	415
		සෞඛ්‍ය සහ පෝෂණ ගැටලු පිළිබඳ මවුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන්	1531
		පෝෂණ ආහාර වට්ටෝරු හඳුන්වාදීමේ ප්‍රායෝගික වැඩසටහන්	815
5	**පාසල් වැඩසටහන්**	කායික හා මානසික සෞඛ්‍ය පිළිබඳ පාසල් සිසුන්/ආචාර්ය මණ්ඩලය/මවුපියන් දැනුවත් කිරීමේ වැඩසටහන්	119
		පාසල් දරුවන් සඳහා ඔසු පැළ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්	42
		පාසල් ආශ්‍රිත සායනික සේවා වැඩසටහන්	57
6	**ප්‍රජා මූලික වැඩිහිටි සෞඛ්‍ය සේවා වැඩසටහන**	ප්‍රජා මූලික වැඩිහිටි සෞඛ්‍ය දැනුවත් කිරීමේ වැඩසටහන්	1256
		සෞඛ්‍ය ගැටලු හඳුනාගැනීම සහ සායන පැවැත්වීම	139
		වැඩිහිටියන් අධීක්ෂණය සඳහා කළ ගෘහ පිවිසුම් ගණන	9658

7	**මාතෘ සංරක්ෂණ වැඩසටහන**	මාතෘ දැනුවත් කිරීම් හා සායන පැවැත්වීම	51
8	**ඖෂධ පැළැටි සංරක්ෂණ හා තිරසාර භාවිතය**	තවාන් කරන ලද පැළ ගණන	776
		බෙදාහරින ලද පැළ ගණන	5981
		ආදර්ශ ඖෂධීය ගෙවතු පිහිටුවීමේ වැඩසටහන	1325
		ඔසු උයන් පිහිටුවීමේ වැඩසටහන	31
		සරල අත්බෙහෙත් හඳුන්වාදීමේ වැඩසටහන්	643
		ආර්ථික භෝග ලෙස ඔසු වගාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්	371
9	මානසික සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන	මානසික සෞඛ්‍ය ප්‍රවර්ධන දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව	
10	**ගෘහ ඒකක දැනුවත් කිරීම**	ආයුර්වේද සෞඛ්‍ය ප්‍රතිපත්ති ගෘහ ඒකකයන්හි ක්‍රියාත්මක කිරීම හා අදාළ සේවා සැපයීම සම්බන්ධ වැඩසටහන්	31945
11	**ප්‍රජා සත්කාරක සේවා හා සෞඛ්‍ය සංරක්ෂණ වැඩසටහන්**	‘‘හෙළවිරු සුවධරණි සුවසේවා’’ වැඩසටහන යටතේ වන වැඩසටහන් 1 දැනුවත් කිරීම් හා සායන සංඛ්‍යාව 2 අධීක්ෂණය කල නිවාස ගණන	 30 215
12	**වෙනත් වැඩසටහන්**		214
13	**වෙනත් වැඩසටහන්**	ඩෙංගු මර්දන වැඩසටහන්	214
		හිසතෙල් ගෑමේ උත්සව සංවිධාන කටයුතු	7
එකතුව			63682

- 2023 වර්ෂයේ සිදු කරන ලද මුළු වැඩසටහන් සංඛ්‍යාව - 75,499
- 2023 වර්ෂයේ සිදු කරන ලද ඒ වැඩසටහන්වල ප්‍රතිලාභීන් සංඛ්‍යාව - 359,719

2.11 ඉදිරි ඉලක්ක හා අභියෝග

2.11.1 ඉලක්ක

1. ජාතික සෞඛ්‍ය පද්ධතිය තුළ වැඩි දායකත්වයක් ලබා දීම සඳහා ආයුර්වේද රෝහල් පද්ධතිය ගුණාත්මකව සහ ප්‍රමාණාත්මකව සංවර්ධනය කිරීම.
2. ආදායම් උත්පාදනය සඳහා දේශීය වෛද්‍ය ව්‍යවසායකත්ව සංවර්ධනය පුළුල් කිරීම.
3. දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයට අදාළ නිෂ්පාදන අපනයනය සඳහා පහසුකම් පුළුල් කිරීම.
4. විදේශයන්ගෙන් ආනයනය කරනු ලබන ඖෂධ මෙරට වගා කිරීම මඟින් ඖෂධ වෙළෙඳපොළ සුලභ කිරීම.
5. වැඩිහිටි සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා ක්‍රමවේදයක් සැකසීම.
6. ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා කටයුතු කිරීම.
7. අවම වශයෙන් පළාතකට එක් ගෙවන වාට්ටු පහසුකම් සහිත ආයුර්වේද රෝහලක් බැගින් ඇති කිරීම.
8. ‘‘හරිතකී’’ නගර ඔසු වන වැඩසටහන යටතේ ඔසු වන වගා භූමි 500ක් බිහි කිරීම.
9. දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය සඳහා රක්ෂණ ක්‍රමවේදයක් හඳුන්වා දීම.
10. අන්තර් ජාතික මට්ටමේ සමුළු හා ප්‍රදර්ශන පැවැත්වීම.
11. රජයේ ඉඩම් ලබාගෙන නව ඔසු උයන් 03ක් ආරම්භ කිරීම.
12. ආයුර්වේද සංරක්ෂණ සහා සමඟ ඒකාබද්ධ මී පැණි නිෂ්පාදන ව්‍යාපෘතියක් ආරම්භ කිරීම.
13. සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම ඇතුළත් අන්තර්ජාතික වෛද්‍ය කලාපයක් ඇති කිරීම.
14. ආයුර්වේද සංරක්ෂණ සහා සමඟ ඒකාබද්ධ මී පැණි නිෂ්පාදන ව්‍යාපෘතියක් ආරම්භ කිරීම.
15. දේශීය වෛද්‍ය ක්‍රම ඇතුළත් අන්තර්ජාතික වෛද්‍ය කලාපයක් ඇති කිරීම.
16. දේශීය ඖෂධ නිෂ්පාදන අපනයනය කිරීම සඳහා දිරිගැන්වීම.

2.11.2 අභියෝග

1. ජාතික සෞඛ්‍ය පද්ධතිය තුළ දේශීය වෛද්‍ය අංශයෙන් ඉටුකරනු ලබන කාර්යභාරය පිළිබිඹු නොවීම.
2. වාර්ෂිකව වෙන්වන ප්‍රතිපාදන මත සැලසුම්කර ඇති ඉලක්ක වෙත ළඟා වීමට ඇති නොහැකියාව.
3. මානව හා භෞතික සම්පත් හිඟය

3. පරිච්ඡේදය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒඑස්-එප්

2023 දෙසැ මිබර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ආයවැය 2023		සටහන	31/12/2023	2,022	
රු.			රු.	රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒඑස්-1
-	ජාත්‍යන්තර වෙළඳාම් මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අයිතම		1,822,586,048	1,659,138,000	ඒඑස්-3
-	ණයකරු		11,965,626	14,488,542	ඒඑස්-4
-	අක්තිකාරම් ගිණුම්		38,686,671	41,935,404	ඒඑස්-5
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		1,873,238,344	1,715,561,946	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		1,873,238,344	1,715,561,946	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ(ඇ)		-	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඈ = (ඇ)-(ඇ)		1,873,238,344	1,715,561,946	
	අඩුකළා : වියදම්				
-	ප්‍රතිසංවිධානය වියදම්				
1,541,581,200	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	1,509,647,546	1,500,015,234	
368,062,690	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	422,328,411	326,183,321	ඒඑස්-2(ii)
14,400,000	ඝණකාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	10,921,552	13,007,535	
-	පොළී ගෙවීම්	8		-	
-	වෙනත් ප්‍රතිසංවිධානය වියදම්	9	-	-	
1,924,043,890	මුළු ප්‍රතිසංවිධානය වියදම් (ඒ)		1,942,897,509	1,839,206,091	
	මූලධන වියදම්				
20,260,000	මූලධන වත්කම් ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීම්	10	44,533,653	15,781,981	
9,581,610	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	220,000	8,244,428	
509,311	ප්‍රාග්ධන මාරුකිරීම්	12	831,802	509,311	ඒඑස්-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13		-	
2,260,000	භෞතික වර්ධනය	14	2,114,204	2,030,315	
2,990,689	වෙනත් මූලධන වියදම්	15	3,027,423	1,470,021	
35,601,610	මුළු මූලධන වියදම් (උ)		50,727,083	28,036,056	
	නඳුන්වනු ලෙවීම්		9,008,298	16,754,434	ඒඑස්-4
	අක්තිකාරම් ගෙවීම්		28,466,439	31,179,573	ඒඑස්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (එ)		37,474,737	47,934,007	
	මුළු වියදම් ඔ = (ඒ+උ+එ)		2,031,099,329	1,915,176,154	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඕ = (ඉ-ඔ)		(157,860,985)	(199,614,207)	
	අතිරේ සැසඳුම් ප්‍රකාශනය අනුව ශේෂය		(157,860,985)	(199,614,207)	ඒඑස්-7
1,959,645,500	දෙසැම්බර් 31 දිනට අතිරේ ශේෂය		-	-	ඒඑස්-3
			(157,860,985)	(199,614,207)	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2023 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

		තක්‍ය	
	සටහන	**2,023**	**2022**
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
ගෘහ පළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	5,036,588,467	5,015,761,262
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	97,944,867	108,165,098
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**5,134,533,334**	**5,123,926,361**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
බැංකුවේ ශුද්ධ වත්කම්		89,484,664	102,662,223
ගෘහ පළ පිරියත හා උපකරණ සංචිතය		5,036,588,467	5,015,761,262
ආදායම් හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)	-	
යුතුකම් වගකීම්			
ගෙවීම්පතු ගිණුම්	ඒසීඒ-4	8,460,203	5,502,875
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**5,134,533,334**	**5,123,926,361**

[illegible] අංකෙ.....6....සිට .....60... දක්වා ඒයිඒ 1 සිට ඒයිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු තහා ඇමුණුම් පිටු අංක .....61.... සිට ...92..... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරවි කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. මෙහන අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු හාණ්ඩාගාර ගිණුම් පොත් [illegible] සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය [illegible] කිරීම් සිදුකිරීමටත් වරින් වර සමාලෝචනා සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

[illegible] ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
[illegible]	තනතුර :	නම : ඩී. එම්. එස්. ඒ. ඇබේසිංහ
දිනය : 2024. 02. 27	දිනය : 2024. 02. 29	දිනය : 2024/2/29

ආචාර්ය එම්.ඩී.ජේ. අබේවර්ධන
ආයුර්වේද කොමසාරිස් ජනරාල් (මැ.බ.)
ආයුර්වේද දෙපාර්තමේන්තුව

[illegible], ආයුර්ව බද්ධේදම විමලවංශ ගිම් මාවත, [illegible],
කොළඹ 10.

ඒ.එම්.එම්.ඩී. අබේසිංහ
ප්‍රධාන ගණකාධිකාරි
ආයුර්වේද දෙපාර්තමේන්තුව
නාවින්න, මහරගම.

3.3 මූල්‍ය ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒඕඒ-සී

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	2023 රු.	2,022 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මූල බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් සහනාධාර ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙතුවෙන් එකතු කරන ලද ආදායම්	85,596,727	79,545,245
අග්‍රිම ලැබීම්	1,822,586,048	1,659,138,000
අත්තිකාරම් අයකර ගැනීම්	31,270,224	36,614,389
කැන්පතු ලැබීම්	11,965,626	14,488,542
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**1,951,418,624**	**1,789,786,176**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	1,785,604,263	1,672,127,348
සහනාධාර සහ මාරුකිරීම්	10,713,342	13,007,535
වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම්	107,705,942	39,103,006
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම්		-
අත්තිකාරම් ගෙවීම්	28,160,207	31,179,573
කැන්පතු ගෙවීම්	9,008,298	16,754,434
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**1,941,192,051**	**1,772,171,897**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**10,226,573**	**17,614,279**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භූමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	-	-
උපෂණය අයකර ගැනීම්		-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)		-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	10,226,573	17,614,279
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**10,226,573**	**17,614,279**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(10,226,573)**	**(17,614,279)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදාන	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) +(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන් නැත.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

රු.000

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ප්‍රතිශතයක් ලෙස
2002.01.01	ගොඩනැඟිලි කුලී	1,100	1,100	3,352	304
2002.02.99	පොළිය	3,800	3,800	4,275	113
2003.99.00	අනෙකුත් ආදායම්	15,000	15,000	20,898	139
2006.02.02	මූල්‍ය නොවන වත්කම් විකිණීමේ ආදායම	30	30	22	73

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්යසාධනය

රු.000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලබන ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	1,950,000	1,975,560	1,942,898	98 %
ප්‍රාග්ධන	60,000	64,440	50,726	79 %

3.7 මු. රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. 000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	මූල්‍ය ප්‍රගතිය %
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
01	සෞඛ්‍ය අමාත්‍යාංශය	2022 අයවැය යෝජනා යටතේ මහජනතාව කේන්ද්‍ර කරගත් සෞඛ්‍ය සේවාවක් පවත්වාගෙන යෑම සඳහා වෙන් කළ ප්‍රතිපාදන	4,819	4,819	4,176	87%
02	බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුව	බහුකාර්ය සංවර්ධන සහායකයන් සඳහා වැටුප් ගෙවීමට ප්‍රතිපාදන වෙන් කිරීම	117,264	117,264	101,899	8%6

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු, 000

වත්කම් කේතය	කේත විස්තරය	**2023.12.31** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**2023.12.31** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැඟිලි හා ව්‍යුහයන්	-	1,161,120	-	-
9152	යන්ත්‍රෝපකරණ	-	501,407	-	-
9153	ඉඩම්	-	2,338,520	-	-
9160	WIP (කෙරීගෙන යන වැඩ)	-	1,035,539	-	-

3.9 විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. MED/A/AD/FA/23/02

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2024 මැයි 21 දින

ආයුර්වේද කොමසාරිස් ජනරාල්
ආයුර්වේද දෙපාර්තමේන්තුව

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 14(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 220 - ආයුර්වේද දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආයුර්වේද දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ යඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ආයුර්වේද දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී. ලං. වි. ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම්, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් පැනි විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට නැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට නැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය. ජාතික විගණන පනතේ 38(1)(ඌ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයන් සිදු කර ඒ පනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය පරිදි සකස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සම්මත්‍යයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයින් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- ගෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ ගෙළිදරව් කිරීම් ඇතුළත් මූල්ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වී නිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොනිබුණි.

2022 වර්ෂයේ ශීර්ෂය - 220 ට අදාළ 154(6) වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොනිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.4 (ඇ)	මුදල් රෙගුලාසි 891(1) හි සඳහන් කොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිල්ධාරීන් පිළිබඳ ඇප ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගත යුතුය.	1.5.6 (ඇ)
2.3 (අ)	පංචකර්ම සහ සම්බාහන මධ්‍යස්ථාන නියාමනය සඳහා විධිමත් නෛතික රාමුවක් ඇතිකිරීම සඳහා කටයුතු කළ යුතුය.	2.6 (අ)
2.3 (ඇ)	2019 දෙසැම්බර් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ඇතිලි සලකුණු යන්ත්‍ර මඟින් සනාථ නොකෙරෙන කාල සීමා සඳහා අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීමට කටයුතු නොකළ යුතුය.	2.6 (ඊ)
2.1	ආයතන සංග්‍රහය, ජාතික අයවැය චක්‍රලේඛ සහ රාජ්‍ය මුදල් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ණය අයකිරීමට කටයුතු කළ යුතු අතර එසේ කටයුතු කිරීමේ වගකීම ඉටු නොකළ නිලධාරීන්ගෙන් අධිභාර කිරීමට මුදල් රෙගුලාසි 104 (2) "ආ" ප්‍රකාරව කටයුතු කළ යුතුය.	2.7
3.4 (ආ)	රාජ්‍ය මුදල් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, නියමිත ආකෘතියේ පිළියෙල කර නියමිත කාළ සීමා තුළ කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය.	3.1.4(ආ)
3.5	රජයේ මුදල් අරපිරිමැසුම්දායක ලෙස භාවිතා කරමින් අත්‍යවශ්‍ය හා ප්‍රමුඛ අරමුණු ඉටුකර ගැනීම සඳහා පමණක් ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කළ යුතු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ නිවැරදිව අනුගමනය කළ බව හා විනිවිදභාවයෙන් කටයුතු කළ බව තහවුරු කිරීම සඳහා ලිඛිත සාක්ෂි පවත්වා ගනිමින් ප්‍රසම්පාදනයන් මෙහෙයවිය යුතුය.	3.4
3.7 (ඌ)	දෙපාර්තමේන්තුව ගෙවූ වැටුප්වලින් හිඟ මුදල් වහාම අයකර ගැනීම සඳහා නීත්‍යානුකූලව කටයුතු කිරීමට හෝ මුදල් රෙගුලාසි 104 (2) "ආ" ප්‍රකාරව වගකිවයුතු නිලධාරීන්ගෙන් අධිභාර කිරීමට හෝ කටයුතු කළ යුතු අතර, පිරිස් පාලන හා වැටුප් පාලන අංශ අතර යාවත්කාලීන අඛණ්ඩ සම්බන්ධතා තහවුරු කෙරෙන පාලන ක්‍රම හඳුන්වා දීමටද කටයුතු කළ යුතුය.	3.5(අ)

3.8 (ඉ) අවස්ථානුවය නිවැරදිව හඳුනා නොගෙන හා නිසි ශ්‍රේණියෙන් අධ්‍යයනයකින් තොරව මිලදී ගෙන තිබූණු ඖෂධ යන්ත්‍ර උපදාශ සේවය ආයුර්වේද රෝහල්වල හෝ ආයුර්වේද සංස්ථාවේ ඖෂධ නිෂ්පාදනයට භාවිතා ගැනීම සඳහා ලබාදීමට කටයුතු කළ යුතු අතර මෙම අනුමිකතාවය සඳහා දායක වූ සියළුම නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගත යුතුය. 3.6 (ඊ)

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූලධන ව්‍යාපෘති

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ප්‍රාග්ධන පාරු කිරීම රු. 831,802ක් හා වෙනත් මූලධන වියදම් රු. 3,027,423ක් ලෙස දක්වා තිබුණද, ඒ.ගි.ප් 2(ii) ආකෘතියේ ඉදිරියේ කරන වැඩමවීමක් අනුව ව්‍යාපෘති ප්‍රකාශයේ ප්‍රාග්ධන පාරු කිරීම රු. 831,802ක් දක්වා නොතිබුණු අතර වෙනත් මූලධන රු.3,859,226ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ප්‍රාග්ධන පාරු කිරීම රු.831,802ක් වැඩියෙන්ද වෙනත් මූලධන වියදම් එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද දක්වා තිබුණි.

1.6.2 අවිල්ම ගැසෙමි ප්‍රකාශයේ ශේෂය

අනොකුත් කිරීම් වලින් අත්හිටුවාරම් "බී" ගිණුමට කථන උද කර කිරීම්වලදී එකතුව හාණ්ඩාගාර මූල්‍ය සටහන (SA-51) අනුව රු. 306,232ක් ක් වූවද, අවිල්ම ගැසෙමි ප්‍රකාශය (ඒ.ගි.ප් 07 පෝරමය) අනුව රු. 2,623,773 ක් ලෙස රු. 2,317,541 ක් වැඩියෙන් දක්වා තිබුණි. දෙපාර්තමේන්තුව වලින් අනොකුත් කිරීම් වෙනුවෙන් අත්හිටුවාරම් "බී" ගිණුමට පදනම් කරන උද බැර කිරීම් රු. 2,317,541 ක් ඒ.ගි.ප් 07 ආකෘතියේ දැක්විය යුතු නමුත් එසේ නොකිරීම හේතුවෙන් මෙම වටිනාම අවශ්‍යතා නිසියඳු බව නිරීක්ෂණය විය.

1.6.3 මූලධන නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරුණු දැක්වේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නීතානුකූලව දෙපාර්තමේන්තුව වෙත අයිතිය සවරාගෙන නොතිබුණු ඉඩම් 12 ක වටිනාකම් වූ රු. 2,318,020,000 ක් මූල්‍ය ප්‍රකාශනවල මූලධන නොවන වත්කම් යටතේ දක්වා තිබුණු අතර නීතානුකූලව දෙපාර්තමේන්තුවට අයිතිය සවරා ගෙන තිබුණු ඉඩම් 07 ක වටිනාකම් සඳහාගෙන නිෂ්ඵලභාව කර නොතිබුණි.

(ආ) සියලු පරිගණක පුවරුන් සවෙන් ප්‍රකාරව වෙනත් යන්ත්‍ර හා උපකරණ වැය ලිඛය යටතේ රු.20,996,825ක් සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයට ගලපා තිබුණද ඊට අදාල වත්කරුක්ෂය කොරතුරු පිළිගෙල කර නොතිබුණු අතර ආරම්භක ශේෂයන්ට සිදු කරන ලද එම සංශෝධනයන් පිළිබඳ විණුම් සටහන් මඟින් හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2022 වර්ෂයේ සියලු පරිගණක මූලික සටහන් අනුව කාර්යාල උපකරණවල අවසාන ශේෂය රු.76,362,170ක් වූවද, එම ශේෂය 2023 වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස සටහන් කිරීමේදී රු.75,972,550ක් ලෙස සටහන් කිරීම හේතුවෙන් රු.389,620ක් අඩුවෙන් විණුම් වල දක්වා තිබුණි.

(ඇ) 2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව විසින් කොමිසර් ජනරාල් වෙත වාර්තාකර තිබුණු ගොඩනැගිලිවල වටිනාකම් රු.635,961,733කින් අඩු කිරීමෙන පසු වටිනාකම් 1,161,120,186ක් වූයෙන් රු.525,158,453ක ශුද්ධ වෙනසක් නිරීක්ෂණය විය. රු. 551,760,744 ක් වටිනා ගොඩනැගිලි 13 ක් කොමිසර් ජනරාල්ට වාර්තා නොකිරීමත්,කොරල්ල රෝහලේ ගොඩනැගිලි රු. 40,800,000 ක් අඩුවෙන් හා තිරප්පනේ ප්‍රදා සෙමෙය මධ්‍යස්ථානය ගොඩනැගිලි රු. 9,000,000 ක් වැඩියෙන් වාර්තා කිරීමත්, රු. 58,402,291 ක් වටිනා ගොඩනැගිලි 12 ක් කොමිසර් ජනරාල්ට වාර්තා කළ නමුත් ගිණුම්ගත නොකිරීමත් මෙම වෙනසට හේතුවී තිබුණි.

(ඈ) 2021 වර්ෂයේ සියාක් පරිගණක මුදුන ඝටනත් අනුව කාර්යාල උපකරණවල අවසාන ශේෂය රු.71,471,751ක් වුවද, එම ශේෂය 2022 වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස සටහන් කිරීමේදී රු.69,658,751ක් ලෙස සටහන් කිරීම හේතුවෙන් රු.1,813,000ක් පමණවෙන් ගිණුම්වල දක්වා තිබුණු අතර දෙපාර්තමේන්තුව විසින් මේ සම්බන්ධයෙන් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර දෝෂ නිවැරදිව හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කරන බව දක්වා තිබුණද සමාලෝචිත වර්ෂයේද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඉ) මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා තිබුණු රු.1,161,120,186ක්වූ ගොඩනැගිලි හා වෘහ වටිනාකම් ඡේද නීතියානුකූලව දෙපාර්තමේන්තුව වෙත අයිතිය පවරාගෙන නොතිබුණු ඉඩම් 13ක පවතින රු.1,107,464,440ක්වූ ගොඩනැගිලිවල වටිනාකම් ඇතුළත්ව තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේද අදාල ඉඩම් පවරාගෙන ගැලපීම් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 2022 වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා තිබුණු පරිගණක උපාංග ශේෂය, වීදුලි උපකරණ ශේෂය සහ වෛද්‍ය උපකරණ ශේෂය පිළිවෙලින් රු.5,881,397ක්, රු.14,835,143ක් සහ රු.275,315,783ක් විය. එසේවුවද පිළිවෙලින් ඉකුත් වර්ෂවල සිදුකළ රු.10,375,439ක්, රු.6,273,197ක සහ රු.3,638,628ක මිලදී ගැනීම් අදාල විෂයයන් යටතේ නොදක්වා කාර්යාල උපකරණ යටතේ දක්වා තිබුණි. තවද, 2022 වර්ෂයේදී මිලදී ගත්තා ලද රු.20,729,160ක්වූ පරිගණක, පරිගණක උපාංග යටතේ නොදත්වා කාර්යාල උපකරණ යටතේ දක්වා තිබුණේ, නමුත් මාරු නියෝග ලබා ගැනීමෙන් අනතුරුව නිවැරදි කරන බව දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂයේද එය නිවැරදි කර නොතිබුණි.

(උ) ධාවන තත්ත්වයේ නොමැති කැබ රථ 02 ක්, බස් රථයක් හා යතුරු පැදි 04ක් අපහරණ කටයුතු සඳහා 2022.02.14 වෙනදා අමාත්‍යාංශය වෙත භාරදී තිබුණද, එම වත්කම්වල පිරිවැය ඉවතාගෙන මූල්‍ය නොවන වත්කම් වලින් ඉවත් කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඌ) කල්බදු වාරික ගෙවීම් ක්‍රමය යටතේ 2012 වර්ෂයේදී ටොයෝටා ලංකා ආයතනයෙන් මිලදී ගෙන තිබුණු පිරිවැය රු.8,400,000 ක් වූ වැන් රථයක් කල්බදු කාලසීමාවෙන් අනතුරුව දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන තිබුණද, මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඒ) වැඩ අවසන් ගොඩනැගිලි හා වෘහවල පිරිවැය ප්‍රාග්ධනීත නොකර 2018 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ඉදිකිරීම් සඳහා දැරූ සම්පූර්ණ වියදම් කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි. ඒ පසුව සමාලෝචිත වර්ෂය දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩ ගිණුමේ ශේෂය රු.1,035,539,978 ක් දක්වා වර්ධනය වී තිබුණි.

1.6.4 විගණනය සඳහා සාක්ෂි හෙළිවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු. 5,036,588,467ක්වූ වේදනා, පීඩාසහ ජීවිතය ගැන උපකල්පිත වලට අදාළ ගෙවීම්වල සම්පිණ්ඩනය සඳහා ඉදිරිපත් කර නොතිබිණි.

(ආ) සඳහන්කරමින්තුළ සහිත රු.93,944,999 ක් වටිනා වාහන පවතින බව සිදුවන පරීක්ෂණවලදී වාර්තා කර තිබුණු නමුත් සිතාන් වර්ෂාන්තයේ එක් එක් වාහනය පිළිබඳ විස්තරාත්මක තොරතුරු සඳහන් කර නොතිබුණු බැවින් සඳහන්කරමින්තුළ සහ ඔයාල වාහනවල වර්ෂාන්ත සිදුවන පුනරාවර්තනවල නිරූපනයවන බවට තහවුරු කර ගැනීමට හැකියාව නොතැබී විය.

1.6.5 ලේඛන හා සොයාගත් වවත්වා නොගැනීම

ඉදිරිපත්කිරීම්වලට පිළිබඳ පහත දැක්වෙන ලේඛන සවත්වා නොතිබුණු හෙයි, ප්‍රායෝගික ලේඛන විධිමත්ව හා යාවත්කාලීනවූ වවත්වා නොතිබුණු බව නිසැකව විගණන වර්ෂාන්තවලදී නිරීක්ෂණය විය

	ලේඛන හා සොයාගත් වර්ගය	අදාළ නීතිවලපාඨය	නිරීක්ෂණය
(අ)	වවත්වාගත් යුතුවූ ලේඛනය	මූල්‍ය රෙගුලාසි 388	යාවත්කාලීනව වවත්වාගෙන ගොස් නොතිබුණි.
(ආ)	ණය සැණකෙළ ලේඛනය	මූල්‍ය රෙගුලාසි 891(1)	යාවත්කාලීනව වවත්වාගෙන යොස් නොතිබුණි.
(ඇ)	වාහන ලොග් පොත්හි සඳහන්	මූල්‍ය රෙගුලාසි 1645(අ)	යාවත්කාලීනව වවත්වාගෙන ගොස් නොතිබුණි.

2. මූල්‍ය කළමනාකරණය

2.1 අදාළ කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ අදාළ කැලණිය අනුව ආණ්ඩුකාරතුමන්ගේ ඉල්ලුම් කරන ලද අදාළ ප්‍රතාපය රු.1,858,470,000 ක් වූවත් ආණ්ඩුකාරතුමාගේ නිදහස් කළ ප්‍රතාපය රු.1,839,643,233ක් වූ හැරීගේ රු.18,826,747ක අදාළ ප්‍රතාපයක් ඇදුලුම් කළ බවදී ආණ්ඩුකාරතුමන්ගේ නිලධාරී නොනිවිම නිසා පාර්ලිමේන්තුව විසින් යලදා තිබුණු ප්‍රතිපාදන කාර්යක්ෂමව උපයෝජනය නිරීක්ෂණ නොහැකිවී තිබුණි.

2.2 විසඳුම් කළමනාකරණය

මූල්‍ය රෙගුලාසි 50 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව නිවැරදි හා සත්‍යවූ ඇස්තමේන්තු සිදුකෙල කර නොතිබුණු බව පහත දැක්වෙන කරුණු අනුව නිරීක්ෂණය විය.

(අ) වැඩසටහන් 01 හි මූලධන වැය විෂය යටතේ 2103 සඳහා ප්‍රතිපාදන වෙන්කරගෙන තොතිබිණ. ඒ සඳහා වර්තමාන මූලධන වැය විෂයයටින් රු. 260,000 ක් වියදම්කර තිබුණු අතර ඉන් රු. 40,000 ක් ගෙවීම් ඔයෙට 15 ඉතිරිව තිබුණි.

(ආ) වවසායතාවය නිසියතාවයට සඳහාගැනීමෙහි අතරමැදි වැඩ සටහන් 02 හි වැය විෂයය යටතේ 2003 සඳහා රු. 400,000 ක් හා 2105 සඳහා රු. 1,000,000 ක් ප්‍රතිපාදන වෙන් කර ගැනීම සම්බන්ධයෙන් එම සම්පූර්ණ මූල්‍යයක් විසඳුම් නොකර ඉතිරිව තිබුණි.

(ඇ) වාර්ෂික අවශ්‍යතාවය නිසියාකාරව හඳුනා ගැනීමකින් තොරව ප්‍රතිපාදන සලසා ගැනීම හේතුවෙන් වැඩසටහන් 02 කට අදාළ මූලධන වැය විෂයයන් 10 ක රු.15,000,000 ක්වූ ශුද්ධ ප්‍රතිපාදන වලින් රු. 11,453,248ක් වෙවත් කිසියම් 22ක් 97ක් අතර පරාසයක ප්‍රතිපාදන ඉතිරිව තිබුණි.

(ඈ) මූලික වියදම් ඇස්තමේන්තුවේ මූලධන හා පුනරාවර්තන වැය විෂයයන් 16ක ප්‍රතිපාදනය කිසියම් 19 ක් කිසියම් 2,000 අතර පරාසයකින් වැඩි කරමින් සහ තවත් වැය විෂයයන් 05ක ප්‍රතිපාදනය කිසියම් 54 ක් කිසියම් 83ක් අතර පරාසයකින් අඩුකරමින් සංශෝධනය කිරීම හේතුවෙන් මූලික වියදම් ඇස්තමේන්තුව නිසි අධ්‍යයනයකින්, අවබෝධයකින් තොරව හා අනාවැකියට පිළිගැලපෙන කර නිබුණු බව නිරීක්ෂණය විය.

2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 94(1) විධිවිධාන වලට පැටහැනිව පුනරාවර්තන හා මූලධන වැය විෂයයන් 36ක රු. 12,964,091ක්වූ ඉතිරිවීම් ඉක්මවා රු. 37,942,645ක බැරකම් වලට බැඳී තිබුණි. තවද වැය විෂයය අංක 2-5-0-1201 යටතේ ලිඳිදුවා හා කාර්යාල අවශ්‍යතා සඳහා සම්ප්‍රේෂිත වර්ෂයේ ප්‍රතිපාදන සලසා නොගෙන බැරකම් වලට බැඳී තිබුණි.

(ආ) සම්ප්‍රේෂිත වර්ෂයේ ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවෙන් ලබාගෙන තිබුණු ඖෂධ වෙනුවෙන් දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු මුදල් රු. 6,710,968ක් බව එම සංස්ථාව නිකුත් කළ ණය සහතිකයේ දක්වා තිබුණි. එසේ වුවත් එම සංස්ථාවට ගෙවිය යුතු මුදල් රු.185,000 ක් පමණ දෙපාර්තමේන්තුවේ බැරකම් හා බැඳීම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබුණි.

(ඇ) ඉහත් වර්ෂවලදී ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවෙන් ලබා ගෙන තිබුණු ඖෂධ වෙනුවෙන් සම්ප්‍රේෂිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 1,265,768 ගෙවිය යුතුව පවතින බව එම සංස්ථාවේ නිකුම් අනුව තහවුරු වූ නමුත් එම බැරකම් දෙපාර්තමේන්තුවේ බැරකම් හා බැඳීම් පිළිබඳ ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි.

2.4 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

ආයුර්වේද දෙපාර්තමේන්තුව වෙත වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 02කින් අවශ්‍යතා 05ක් සඳහා ලබාදුන් රු.53,083,332ක ප්‍රතිපාදන වලින් සම්ප්‍රේෂිත වර්ෂය අවසානයේ රු.15,630,895ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එකී ප්‍රතිපාදන ඉතිරිවීම් මුළු ප්‍රතිපාදන වලින් කිසියම් 08 සිට කිසියම් 31 දක්වා පරාසයක් ගෙන තිබුණි.

2.5 ගණන්දීමේ නිලධාරි විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 (1) (සැ) වගන්තිය අනුව ගණන්දීමේ නිලධාරී, දෙපාර්තමේන්තුවේ මූලය පාලනය සඳහා සවිලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට සහතික විය යුතු අතර එම පද්ධතියේ සවිලදායිභාවය පිළිබඳව කලින් කල සම්ප්‍රේෂණ සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය පවතින්නම් සිදු කරනු ලැබිය යුතු බවත්, පනතේ 38 (2) වගන්තිය අනුව එම සම්ප්‍රේෂණයන් ලිඛිතව සිදු කර එහි පිටපත් විගණකාධිපතිවරයාට ලබා දිය යුතු බවත්, දක්වා ඇති නමුත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

2.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත වීග්‍රහ කර දැක්වේ.

නීති රීති විධිවිධානවලට යොමුව		අනුකූල නොවීම
(අ)	1961 අංක 31 දරන ආයුර්වේද පනත	පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව ආයුර්වේද ආරෝග්‍ය ශාලා, ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාර, ආයුර්වේද ඖෂධ ශාලා හෝ ආයුර්වේද බෙහෙත් ගබඩා ආයුර්වේද කොමිසාරිස්වරයා විසින් ලියාපදිංචි කරනු ලැබිය යුතු වුවද, පංචකර්ම සහ යම්බාහන මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම පිළිබඳ විධිවිධාන පනතට ඇතුළත් කර නොතිබුණු බැවින් පංචකර්ම වෛද්‍ය ක්‍රමය භාවිතය නියාමනය කළ නොහැකිවී තිබුණි.
(ආ)	1947 අංක 16 දරන මහ නගර සභා ආඥා පනතේ 127 වගන්තිය	බොරැල්ල ආයුර්වේද ජාතික රෝහල ශික්ෂණ රෝහලක් බවට සංවර්ධනය කිරීමේ 02 වන අදියර යටතේ ඉදිකරන ලද මහල් 08 කින් යුතු නව ගොඩනැගිල්ලේ බිම් මහල ඇතුළුව මහල් 04 ක ඇඳන් 183කින් යුත් සමාන්‍ය වාට්ටු 05ක රෝගී සත්කාර සේවා ක්‍රියාත්මක කර තිබුණු නමුත් විධිවිධාන ප්‍රකාරව අනුකූලතා සහතිකයක් ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නෙන නොතිබුණි.
(ඇ)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූදල් රෙගුලාසි සංග්‍රහය**	
	(i) මූදල් රෙගුලාසි 770	බොරැල්ල ආයුර්වේද ජාතික රෝහලේ වියළි ඖෂධ ගබඩාව තුළ දීර්ඝ කාලයක සිට භාවිතයට නුසුදුසු තත්ත්වයේ ඖෂධ වර්ග 12 ක කිලෝග්‍රැම් 113.5 ක ප්‍රමාණයක්ද වර්ෂ 3කට අධික කාලයක් තිස්සේ භාවිතයට නොගන්නා වියළි ඖෂධ වර්ග 36ක කිලෝග්‍රැම් 477.6 ක්ද පැවැති නමුත් ඒවා සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගක් ගැනීම සම්බන්ධව අවධානය යොමුකර නොතිබුණි.
	(ii) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මූදල් චක්‍රලේඛය මඟින් සංශෝධිත මූදල් රෙගුලාසි 756(6)	ඉකුත් වර්ෂ ගණනාවක සිට සමාලෝචිත වර්ෂය දක්වාම ආයුර්වේද රෝහල් තොග ගබඩා හා උපගබඩාවල තොග ලේඛන ගත භාණ්ඩ පිළිබඳ වාර්ෂික සමීක්ෂණ සිදුකර නොතිබුණි.

	(iii) මූදල් රෙගුලාසි 758(1)	වාර්ෂික සමීක්ෂණයට අමතරව යටත් පිරිසෙකින් නෙමසකට වරක්වත් බඩු ලේඛන වවුචර යමඟ සසඳා බඩු ලේඛන පොක පරීක්ෂණ යෝදිසි වලට භාජනය කිරීමටද, නොග ශේෂයයන් සමඟ සසඳා ඇත්ත වශයෙන්ම තොගයෙහි පැහි භාණ්ඩ කිහිපයක් හරි වැරදි බැලීමද කලයුතු වුවත් ආයුර්වේද රෝහල්වල එකී විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
	(iv) මූදල් රෙගුලාසි 1645 (අ)	වාහන පරිපාලනය භාර නිලධාරීන් විසින් දෛනික ධාවන සටහන්, නිතිපතා පරීක්ෂා කර නොතිබුණි.
	(v) මූදල් රෙගුලාසි 1645 (ඇ)	එක් එක් ගමන නිමකළ වහාම දෛනික ධාවන සටහනේ කළ යුතු සියලුම සටහන් පැතුළත් කර වාහනය පාවිච්චි කළ නිලධාරියාගේ කෙටි අත්සන ලබා ගත යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ අවස්ථා ගණනාවකදී එලෙස කෙටි අත්සන් ලබාගෙන නොතිබුණි.
(ඇ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය	රජයේ වාහනවල සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ කිලෝමීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිම සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන දහනය පරීක්ෂා කළ යුතු වුවද දෙපාර්තමේන්තුවේ වාහන සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි.
(ඉ)	2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය සහ 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපිය	සියළුම රජයේ ආයතන වල ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතා කිරීම මඟින් නිලධාරීන් කාර්යාලයට පැමිණීම හා පිටවීම සනාථ කිරීම සම්බන්ධයෙන් වාර්තා නඩාගත යුතු බවට උපදෙස් හා විධිවිධාන නිකුත් කර ඇතත් ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතයකින් තොරව පැමිණීමේ ලේඛන පමණක් පදනම් කර ගනිමින් සමාලෝචිත වර්ෂයේදී ආයුර්වේද රෝහල් 11 ක නිලධාරීන් 1066 දෙනෙකුට වැටුප්, අතිකාල හා නිවාඩු දින වැටුප් හා වෙනත් දීමනා ලෙස රු.1,034,613,812 ක් ගෙවා තිබුණි.

(ඊ)	2015 මැයි 28 දිනැති පොදු 01-21/2015 දරන සෞඛ්‍ය ලේකම්ගේ චක්‍රලේඛය	බොරැල්ල ආයුර්වේද ජාතික රෝහලේ ආහාර සැපයීමේදී චක්‍රලේඛයේ 6.4 හා 6.5 වගන්තිය ප්‍රකාරව කනිෂ්ඨ සේවකයන්ගෙන් අයදුම් පත්‍රයක් ලබා නොගැනීම, 6.6 වගන්තිය ප්‍රකාරව නොදන්වා ආහාර ලබා නොගැනීම මත පිරිවැය අයකර නොගැනීම 8.3 වගන්තිය ප්‍රකාරව සෞඛ්‍ය 31 පාකෘතියේ වෙනම ආහාර වට පත්‍රිකා පවත්වා නොගැනීම 11.5 වගන්තියට පටහැනිව ප්‍රාථමික මට්ටමේ නිලධාරියකු විසින් ආහාර පැනවුම් පිළියෙල කිරීම 11.7 වගන්තිය ප්‍රකාරව ආහාර පිළිබඳ හදිසි පරීක්ෂණ නොපැවැත්වීම 15 වගන්තිය ප්‍රකාරව ආහාර නිකුත් කිරීමේදී කාඩ්පත් පාලන ක්‍රමයක් ස්ථාපිත නොකිරීම සහ සැපයුම්කරුවන්ගෙන් ලැබෙන ආහාර ද්‍රව්‍ය නියමිත ප්‍රමාණයෙන් ලැබෙන බවට තහවුරු කර ගැනීම සඳහා පාලන ක්‍රම ස්ථාපිත කර නොමැති වීම ආදී දුර්වලතා පැවැති බව නිරීක්ෂණය විය.

2.7 අත්තිකාරම් ගිණුම් ශේෂ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(ඉ) මු.රෙ.485(4) සහ ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 1.6, 1.7 හා 6.3 වගන්ති හා 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික ඉයවැය චක්‍රලේඛයේ 1.1.7 ඡේදය අනුව ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ තෙමාසයක් තුළ නිරවුල් කළ යුතු වූවද, පලාත් සභා ආයතන වෙත ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ට අදාළව 2023 දෙසැම්බර් 31 දිනට වර්ෂ 10 ක කාල සීමාවක් ඉක්මවා තිබුණු නොපියවූ ණය ශේෂ 02ක එකතුව රු.108,150 ක් හා වර්ෂ 20ක කාල සීමාවක් ඉක්මවා නිබුණු නොපියවූ ණය ශේෂ 02ක එකතුව රු. 64,373ක් විය.

(ආ) ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ 21.3 වගන්තිය ප්‍රකාරව, වැඩ තහනමට ලක්වූ නිලධාරීන් සම්බන්ධයෙන් පැවැත්වෙන විනය පරීක්ෂණ කටයුතු හැකිතාක් අප්‍රමාදව අවසන් කිරීම අත්‍යාවශ්‍ය වූවද, වැඩ තහනමට ලක්වී වර්ෂ 3ත් වර්ෂ 10ත් අතර කාලයක් ගතවී නිබුණු නිලධාරීන් 02 දෙනෙකුගෙන් රු. 177,985 ක් ද, වර්ෂ 20 ක කාලයක් ඉක්මවා නිබුණු නිලධාරීන් 05 දෙනෙකුගෙන් රු. 127,060 ක් ද, අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි.

(ඇ) ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4.2.4 වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව නිලධාරියෙකු විශ්‍රාම ගැනීමට නියමිතව ඇති කල්හි ඔහුගෙන් අයවිය යුතු සියළුම ණය පිළිබඳ විස්තර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතු අතර, 4.2.5 වගන්තිය ප්‍රකාරව නිලධාරියාගේ පරිවර්තිත විශ්‍රාම වැටුපෙන් හෝ පාරිතෝෂික මූදල් වලින් හෝ අයකර ගත යුතුය. නමුත් 2023 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම්ගොස් වසර 02ක් ඉක්ම වූ නිලධාරීන් 11 දෙනෙකුගෙන් අයවිය යුතු රු.619,110 ක් වූ අතර එම ණය අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. එම ණය ශේෂ අතර විශ්‍රාම ගිය නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු වසර 20 කට වඩා පැරණි රු. 62,050 ක්ද විශ්‍රාම් ගිය නිලධාරීන් 03 දෙනෙකුගේ අයවිය යුතු වසර 06කට වඩා පැරණි රු.248,260ක්ද පැවැති බවද නිරීක්ෂණය විය.

(ඇ) 2019 ජූනි 27 දිනැති අංක 05/2019 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ 3(ඉ)(ii) ප්‍රකාරව සේවය හැර ගිය නමුත් නැවත සේවයේ පිහිටුවා නොනිබුණු නිලධාරීන්ගේ ජාතික හැඳුනුම්පත් අංකය මැතිවරණ කොමසාරිස් වෙත ඉදිරිපත් කර පදිංචිය පිළිබඳව විස්තර විමසා ප්‍රාදේශීය ලේකම් මගින් එම නිලධාරීන්ගේ වත්කම් පිළිබඳව නහවුරුවක් ලබා ගැනීමෙන් අනතුරුව නීතිපති මගින් ණය මූදල අයකර ගත යුතු වුවද, 2023 දෙසැම්බර් 31 දින වන විට සේවය හැරගිය වර්ෂ 01ක් වර්ෂ 03ක් අතර කාලයක් ගතවී තිබුණු නිලධාරීන් 09 දෙනෙකුගෙන් රු. 701,686ක්ද, වර්ෂ 05ක් වර්ෂ 10ක් පනර කාලයක් ගත වී තිබුණු නිලධාරීන් 02 දෙනෙකුගෙන් රු. 306,950ක්ද වර්ෂ 20ක් ඉක්මවා තිබුණු නිලධාරීන් 21 දෙනෙකුගෙන් රු. 883,610ක්ද, අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5,4.6 හා 6.3 වගන්තිය හා 2019 ජූනි 27 දිනැති අංක 05/2019 දරණ රාජ්‍ය මූදල් චක්‍රලේඛනයෙහි 03 (ආ) ඡේදය, 2017 දෙසැම්බර් 29 දිනැති අංක 262/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛනයෙහි 04 ඡේදය ප්‍රකාරව මියගිය නිලධාරීන්ගේ ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කල යුතු වුවත්, මියගොස් 2023 දෙසැම්බර් 31 දිනට මාස 06 කට වැඩි කාලයක් ගතවී තිබුණු නිලධාරීන් 08 දෙනෙකුගෙන් අයවිය යුතු මුළු ණය ශේෂය රු. 642,644 ක් වූ අතර එම ණය අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. එවි ණය ශේෂ අතරින් රු. 290,100ක් වසර 10කට පෙර මිය ගිය නිලධාරීන් 04 දෙනෙකුට අදාළ ණය ඉශේෂ වූ අතර රු. 309,254ක් වසර 01ක් 05ක් අතර කාලයකට පෙර මිය ගිය නිලධාරීන් 03 දෙනෙකුටද රු.43,300ක් මාස 06 ඉක්මවූ නිලධාරියකුටද අදාළ ණය ශේෂ විය.

2.8 පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය හිස් වාර්තාවක් ලෙස ඉදිරිපත් කර තිබුණද පල්ලේකැලේ සර්වේක්ෂණ හා ව්‍යාපෘති සේවා ඔසු උයනේ ගස් කපන දම්වැල් කියනක් අස්ථානගත වීම හේතුවෙන් ඩබ්ලිව්.එම්.සෙකියුරිටි සර්විසස් ආයතනයෙන් රු.193,206ක මූදලක් අයකර ගෙන 2023 ජනවාරි 31 දින පොදු තැන්පත් ගිණුමට බැර කර තිබුණි.

2.9 නැන්පතු

පහත සඳහන් නිරීක්ෂණ කරුණු ලැබේ.

(අ) භාණ්ඩාගාර පොදු තැන්පත් ගිණුම් 3 ක පැවැති වසර 2 ත් 5 ත් අතර කල් ඉකුත් වූ හා එකතුව රු. 354,958ක් වූ තැන්පතු මූදල් රෙගුලාසි 571 නියාදනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද වසර 2 ඉක්මවූ තැන්පතු පැවතීමට හේතුවූ කරුණු රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ 03 ප්‍රකාරව වාර්තා කර නොතිබුණි.

(ආ) කාල විශ්ලේෂණය අනුව වසර 1ත් 2ත් අතර හා වසර 2ත් 5ත් අතර කොන්ත්‍රාත් සඳහා වූ රැඳවුම් තැන්පතු පිළිවෙලින් රු.277,504 ක් හා 62,883 ක් ලෙස දක්වා තිබුණු නමුත් එය පිළිවෙලින් රු.129,234ක් හා 211,153ක් යුතු බව නිරීක්ෂණය විය.

(ඇ) නෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් නාවකාලිකව රඳවා ගන්නා තැන්පතු ගිණුමට අදාළ කේවල ශේෂ ලැයිස්තුව අනුව 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.3,038,130 ක් වූවත් තැන්පතු ගිණුමට අනුව ශේෂය රු.3,762,375ක් විය. ඒ අනුව රු.724,245ක වෙනසක් නිරීක්ෂණය විය.

2.10 නත්තකාර්ය අකුරු අඟීම් නිකුත් කිරීම හා පියවීම

2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මූදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මූදල් රෙගුලාසි 371(2) (ආ) ප්‍රකාරව නිලධාරීන් 06 දෙනෙකු වෙත අවස්ථා 04 කදී ලබාදෙන ලද එකතුව රු.469,179ක් වූ නත්කාර්ය අකුරු අඟීම් වැය නොකර දින 03ක් 20ක් අතර කාලයක් එම මූදල් අක රඳවාගෙන මුළු මුදලම පියවා තිබුණි.

3. මෙතෙයුම් සමාලෝචනය

3.1 කාර්යය සාධනය

3.1.1 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණු නමුත් ඊට අනුගතව කටයුතු කර නොතිබුණු අතර අරමුණු හා ප්‍රතිපත්ති වෙනස් කිරීමෙදී ඒ අනුව ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මානව සම්පත් සංවර්ධන සැලැස්ම අනුව පුහුණු වැඩසටහන් 09ක් සැලසුම් කර තිබුණද ඉන් වැඩ සටහන් 06 ක් පමණක් පවත්වා තිබුණි.

3.1.2 කාර්යයභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන 2001 වර්ෂයේ සිට 2005 වර්ෂය දක්වා නියමු ව්‍යාපෘතියක් ලෙස පනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කර එහි සාර්ථකත්වය අනුව 2005 වර්ෂයේ සිට අනෙකුත් දිස්ත්‍රික්ක සඳහා සේවා ව්‍යාප්ත කළ යුතු වුවද, අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පමණක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා 2005 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා රු.මිලියන 877.2 ක් වැය කර තිබුණි. නමුත් 2022 වර්ෂයේ සිට වෙනම එම ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන සලසා නොගෙන සංවර්ධන වැඩසටහනේ රෝගී ප්‍රතිකාර සේවා ව්‍යාපෘතිය යටතේ වැටුප්, දීමනා, ගිවිසුම්ගත සේවා ඇතුළු පුනරාවර්තන වියදම් සඳහා පමණක් ප්‍රතිපාදන සලසා ගෙන සමාලෝචිත වර්ෂය දක්වා නිලධාරීන් 284 දෙනෙකුට වැටුප් හා දීමනා වශයෙන් රු.මිලියන 287.4 ක්ද අනෙකුත් වියදම් සඳහා රු.මිලියන 5.5 ක්ද වශයෙන් මුළු එකතුව රු.මිලියන 292.9 ක් වැයකර තිබුණි. ඒ අනුව අනෙකුත් දිස්ත්‍රික්ක ආවරණය කරමින් ව්‍යාප්ත කිරීමට තරම් සාර්ථකත්ව ක්‍රියාත්මක නොවූ මෙම ව්‍යාපෘතියට අදාළ පුනරාවර්තන වියදම් පමණක් දෙපාර්තමේන්තුවේ වැය විෂයයන් මගින් ආවරණය කරමින් ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන තව දුරටත් පවත්වාගෙන යාමට කටයුතු කිරීම මතභේදයට තුඩුදෙන කරුණකි.

(ආ) ආයුර්වේද දෙපාර්තමේන්තුව හා එහි අනුබද්ධ ආයතන, රෝහල්, වෛද්‍ය මධ්‍යස්ථාන ඇතුළු සම්පූර්ණ ආයතන පද්ධතියම ඇතුළත්වන පරිදි කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) සැකසීම සඳහා 2021 වර්ෂයේ මෙන්ම 2022 වර්ෂයේදීද රු. මිලියන 25 බැගින් ප්‍රතිපාදන සලසාගෙන තිබුණු නමුත් එම කාර්යය සමාලෝචිත වර්ෂයේදීද ඉටුකර නොතිබුණි.

3.1.3 කාර්යසාධන දර්ශක

දෙපාර්තමේන්තුව හා එහි අනුබද්ධ ආයතන, රෝහල්, වෛද්‍ය මධ්‍යස්ථාන ඔසු උයන් ඇතුළු සම්පූර්ණ ආයතන පද්ධතියට අදාළ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය ඇගයීම සඳහා කාර්යසාධන දර්ශක පිහිටුවා නොතිබුණු අතර ක්‍රියාකාරකම්වල ප්‍රගතිය සමාලෝචනය කර නොතිබුණි.

3.1.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව

මූල්‍ය ප්‍රකාශන සමඟ 2023 වාර්ෂික කාර්යසාධන වාර්තාවේ කෙටුම්පතක් ඉදිරිපත්කර නිබුණු නමුත් එය 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය යටතේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව නිවැරදිව පිළියෙල කර නොනිබුණි.

3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රය, බොරැල්ල ශික්ෂණ රෝහල් ඇතුළුව රෝහල්, ඔසු උයන්, ප්‍රජා සෞඛ්‍ය ප්‍රාදේශීය කාර්යාල; සංචාරක බංගලා ඉඩම් 19 ක් සම්බන්ධ පරීක්ෂය අවසානය වන විටද දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන නොනිබුණි.

(ආ) ඇමෙරිකා එක්සත් ජනපදයේ රෝහල් සේවා පදනම නමැති රාජ්‍ය නොවන සංවිධානයේ ආධාර වශයෙන් 2022 අගෝස්තු මස ලැබී නිබුණු වර්ග 19කට අදාල රෝගී සත්කාරක උපකරණ ඒකක 377 ක් භාවිතයට නොගෙන නව අටමහල් ගොඩනැගිල්ලේ ගබඩාකර නිබුණු අතර එම භාණ්ඩවල වටිනාකම් ගණනය කර ගිණුම්ගත කර ගැනීමටද කටයුතු කර නොනිබුණි.

(ඇ) විශේෂඥ වෛද්‍යවරයකු නොමැති බැවින් උගුර, කන, නාසය සම්බන්ධ වර්ග 10ක ශල්‍ය උපකරණ ඒකක 35ක් හා කොවිඩ් සමයේ චීන රජයෙන් පරිත්‍යාග ලෙස ලැබුණු පුද්ගල ආරක්ෂක ඇඳුම් කට්ටල 21,120ක් බොරැල්ල නව අටමහල් ගොඩනැගිල්ලේ නිශ්කාරව පැවැති බව නිරීක්ෂණය විය.

(ඈ) බොරැල්ල ආයුර්වේද ජාතික රෝහලේ නව අටමහල් ගොඩනැගිල්ලේ සාමාන්‍ය වාට්ටු ඇඳන් 288ක ධාරිතාවයෙන් 120ක් හෙවත් සියයට 42ක්ද රෝහලේ පැරණි සාමාන්‍ය වාට්ටුවල ඇඳන් 274කින් 76ක් හෙවත් සියයට 28ක්ද උණු උපයෝජිතව පැවැති බවද නව ගොඩනැගිල්ලේ නවීන කාමර පහසුකම් වලින් සමන්විත ඇඳන් 88ක ධාරිතාවයෙන් යුක්ත ගෙවන වාට්ටු සියල්ලම සහ පැරණි ගෙවන වාට්ටු 32කින් 08ක් උණු උපයෝජිතව පැවති බවද නිරීක්ෂණය විය.

3.3 රජයේ නිලධාරීන් ඇප තැබීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාජ්‍ය නිලධාරීන්ගේ ඇප අඳා පනතේ 612 වැනි අධිකාරිය, මුදල් රෙගුලාසි 880 හා 881 යන 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 09 ඡේදය ප්‍රකාරව 2024 මාර්තු 31 දින වන විටත් ආයුර්වේද දෙපාර්තමේන්තුව හා ඊට අයත් ආයතන වල ඇප තැබිය යුතු නිලධාරීන් 18 දෙනෙකු එකී විධිවිධාන ප්‍රකාරව ඇප තැබීමට කටයුතු කර නොනිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 892 ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන්ගේ සංශෝධිත වාර්තාවක් සෑම වර්ෂ 03 ක් අවසානයට පසුව යෙදෙන පෙබරවාරි 15 දිනට ප්‍රථම අදාල අමාත්‍යාංශයේ ලේකම් හා විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතුය. මෙම වාර්තාව සම්බන්ධව කවදාවත් ඇප තැබීමට අවශ්‍ය නොවන නිලධාරීන්ගේ නම්ද, ඇතුලත් විස්තරාත්මක වාර්තාවක් යැවීමට කටයුතු කල යුතු වුවත් එලෙස ක්‍රියා කර නොනිබුණි.

3.4 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරුණු ලැබේ.

(අ) 2020 ජනවාරි 28 දිනැති හා 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රවර්ථන වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර යකස් කොට ඒ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගෙන එහි පිටපත් විගණකාධිපති වෙත එවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) රුපියල් මිලියන 1,164.13ක් වැය කර ඉදිකරන ලද බොරැල්ල ආයුර්වේද ජාතික රෝහලේ නව ගොඩනැගිල්ලේ වැඩ නිමකර වසර 03කට අධික කාලයක් ගතවී තිබුණද ගොඩනැගිල්ල පූර්ණ ධාරිතාවයෙන් උපයෝජනය කිරීමටු අවශ්‍ය ප්‍රධාන ජල ටැංකියක්, පල්දෝරු පද්ධතියක් හා ප්‍රධාන විදුලි සම්බන්ධතාවය ආදී කාර්යයන් අවසන් කර නොතිබුණි. ඒ සඳහා 2023 පෙබරවාරි 10 දින රු.715,267,800 ක මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සිළියෙල කර තිබුණු නමුත් එය ඉටු කිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.3 මාර්ගෝපදේශීය ප්‍රකාරව සිළියෙන් පායතනයක් වෙත යොමු කර ප්‍රමිතිය සම්බන්ධයෙන් වූ රසායනාගාර පරීක්ෂණ වාර්තා ලබා ගැනීම්කින් තෙරව සමාලෝචිත වර්ෂයේ භාහරවන කාර්තුවේ කලතෙල් බෝතල් 1,980ක්, මිනෙල් බෝතල් 22ක්, මී පැණි බෝතල් 400ක් හා අබතෙල් බෝතල් 200ක් මිළ දී ගෙන තිබුණි.

3.5 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණ කරුනු ලැබේ.

(අ) මංචංතොඩුවායි ආයුර්වේද රෝහලේ සේවය කර වෙන්නප්පුව ප්‍රාදේශිය සභාවට ස්ථාන මාරුවී තිබුණු ආයුර්වේද වෛද්‍යවරයෙකුට 2012 ජූලි මාසයේ සිට 2013 සැප්තැම්බර් මාසය දක්වා මාස 15 ක් තුළදී දෙපාර්තමේන්තුව විසින් වැටුප් ලෙස රු.548,376 ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා වගකිව යුතු නිලධාරීන්ට අදාළව කටයුතු නොකර සියයට 25ක අධිභාරයක්ද ද සමඟ 2024 අප්‍රේල් 05 දින වන විට රු.519,600 ක් පමණක් අයකර ගෙන තිබුණි. මෙම සිද්ධියට වසර 10කට අධික කාලයක් ගතවී තිබුණු නමුත් ඉතිරි රු.165,870 ක මුදල අහිමි අයකර ගැනීම සඳහා අදාළ වෛද්‍යවරයාට අදාළව නීත්‍යානුකූලව කටයුතු කිරීමට හෝ මුදල් රෙගුලාසි 104 (2) "ආ"පරිදි වගකිවයුතු නිලධාරීන්ගෙන් අධිභාර කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ආ) කොළඹ මහ නගර සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු විසින් බොරැල්ල, ශ්‍රී ලංකා ජාතික ආයුර්වේද රෝහල් ගබඩාවේ පැවති කොත්තමල්ලි තෙගයක් පරීක්ෂාවට භාජනය කර එය පරිභෝජනයට නුසුදුසු බව දන්වා ඖෂධ නිෂ්පාදනාගාරයේ කාමරයක දමා මුද්‍රා තබා වසරකට වැඩි කාලයක් ගත වී තිබුණු නමුත් නිසි පරිදි ඉදිරි ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් පිරිවැය රු.327,700 ක් වූ කොත්තමල්ලි කිලෝග්‍රෑම් 1130ක් විනාශ වී තිබුණි. එසේ වුවද මුදල් රෙගුලාසි 104 (1) පරිදි ඊට වගකිව යුතු පාර්ශවයන් නිශ්චය කර එම හානියේ අලාභය ඔවුන් වෙතින් අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

3.6 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුව සතුව ඔසු උයන් 08ක් පවතින අතර සමාලෝචිත වර්ෂයේ ඔසු උයන් 05කින් පමණක් ඖෂධීය ලමුද්‍රව්‍ය වර්ග 35කින් කිලෝග්‍රෑම් 629.17ක් ලබා ගෙන ආයුර්වේද ජාතික රෝහලට කිලෝග්‍රෑම් 552ක්ද, ඛණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය වෙත කිලෝග්‍රෑම් 18ක්ද, ආයුර්වේද ඖෂධ සංස්ථාව වෙත කිලෝග්‍රෑම් 59.5ක් සපයා තිබුණි. ඉකුත් වර්ෂයේ ඔසු උයන් 03කින් පමණක් ඖෂධ වර්ග 06කින් කිලෝග්‍රෑම් 531ක් ලබාගෙන තිබුණු අතර නාවින්න, කන්නෙලිය හා මිහින්තලේ යන ඔසු උයන් වලින් ඉකුත් වර්ෂයේ මෙන්ම සමාලෝචිත වර්ෂයේදීත් කිසිදු ඖෂධ වර්ගයක් සපයා ගෙන නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව සතුව බස් රථ 02 ක්, ලොරි රථ 02 ක්, කැබ් රථ 07 ක්, වෑන් රථ 06 ක්, මෝටර් කාර් 07 ක්, ජීප්රථ 01 ක්, ගිලන්රථ 09 ක්, ට්‍රැක්ටර් 05 ක් ට්‍රැක්ටර් 11 ක් , බවුසර් 02 ක් හා යකුරුහැදි 05 ක් ඇතුළු වාහන 57 ක් පැවැති අතර මෙම වාහනවලට අදාළ ලොග් පොත් හා ධාවන සටහන් විධිමත් පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබීම, කාලීනව ඉන්ධන පරීක්ෂාවන් සිදුකර නොතිබීම, ඇතැම් නිලධාරීන් නිසි අනුමැතියකින් තොරව වාහන භාවිතා කර තිබීම, වාහන අවභාවිතා කල නිලධාරීන් හා රියදුරන් සම්බන්ධයෙන් වීනය පියවර නොගැනීම,වාහන සඳහා ඉන්ධන පිරවීමේදී එම කටයුතු මාණ්ඩලික නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ සිදුකර නොතිබීම, ඇතැම් නිලධාරීන් නිසි අනුමැතියකින් තොරව වාහන භාවිතා කර තිබීම හා වාහන අවභාවිතා කල නිලධාරීන් හා රියදුරන් සම්බන්ධයෙන් වීනය පියවර නොගැනීම, වාහන ධාවන අවසර පත්‍ර පරීක්ෂාවන් නිසි පරිදි සිදු නොවීම සහ රියදුරන්ගේ අකුමිකතාවයන් වලක්වා ගැනීම් සඳහා ප්‍රමාණවත් පාලන ක්‍රම අනුගමනය නොකිරීම යනාදී කරුණු හේතුවෙන් දෙපාර්තමේන්තුවේ වාහන පරිපාලනය හා වාහනවල ආරක්ෂාව සම්බන්ධයෙන් සතුටුදායක තත්ත්වයක් නොපැවැති බව නිරීක්ෂණය විය.

(ඇ) වර්ෂ කිහිපයක අනුමත නිවාඩු ප්‍රමාණය ඉක්මවා නිවාඩු ලබා ගෙන තිබුණු බොරැල්ල ජාතික ආයුර්වේද රෝහලේ ආයුර්වේද සේවා සහයකයින් 08 දෙනෙකුගේ උසස්වීම් අයදුම්පත් නිර්දේශ කර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමේදී ඔවුන්ගේ වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර දක්වා නොතිබුණු බැවින් ඒ පිළිබඳව පවධානය යොමු නොකර 2023 මාර්තු මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි එම නිලධාරීන්ට උසස්වීම් ලබා දී තිබුණු බව නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඈ) බොරැල්ල ජාතික ආයුර්වේද රෝහලේ සේවය කරන නිලධාරීන් 44 දෙනෙකු විසින් නිසි අනුමැතියකින් තොරව ලබාගෙන තිබුණු නිවාඩු සහ අනුමත සීමාව ඉක්මවා ලබාගෙන තිබුණු නිවාඩු දිනයන් වැටුප් රහිත නිවාඩු ලෙස සලකා කටයුතු නොකිරීම හේතුවෙන් රු.453,475 ක වැටුප් වැඩියෙන් ගෙවා තිබුණු බව 2023 ඔක්තෝබර් මස 31 දින සිදු කල නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඉ) අවශ්‍යතාවය නිවැරදිව හඳුනා නොගෙන හා ශක්‍යතා අධ්‍යයනයකින් තොරව 2015 මාර්තු 16 දින රු.මිලියන 28 ක් වැයකර ඛණ්ඩාරනායක ආයුර්වේද පර්යේෂණායතනයට යන්ත්‍ර හා උපකරණ 14 ක් මිලදී ගෙන තිබුණු අතර ඉන් රු.මිලියන 21 ක් වටිනා යන්ත්‍ර 8 ක් 2024 අප්‍රේල් 10 වන විටත් සවිකර නොතිබුණි. මුළු පිරිවැය රු.14,591,311 ක් වූ යන්ත්‍ර 06 ක් නිෂ්පාදනාගාරය සඳහා අවශ්‍ය නොවන බවට 2020 ඔක්තෝබර් 05 දින පත්කර තිබුණු කමිටුවක් විසින් හඳුනාගෙන තිබුණි. නිසි කොන්ත්‍රාත් ගිවිසුමකට සහ සේවා හා අළුත්වැඩියා සඳහා ගිවිසුම්වලට එළඹීමකින් තොරව මෙම කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කර තිබුණු බැවින් සවිකර තිබුණු යන්ත්‍ර උපකරණද සමාලෝචිත වර්ෂය වන විට භාවිතයට ගත නොහැකි තත්වයේ පැවතුණි. මේ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා වැය කර තිබුණු රු. 28,342,712 ක මුළු මුදල අනාර්ථික වියදමක් විය.

(ඊ) කොළඹ වින්ච් විද්‍යාලය යටතේ පාලනය වන දේශීය වෛද්‍ය සේවාත් උපාධි ආයතනය 2017 ජූනි 02 වැනි දින ගැසට් පත්‍රයේ 05 වන ඇමතිලේ ස්ථාපිත කර තිබුණද ඒ සඳහා විධිමත් ගිවිසුම්කට ඇතුළු නොවීම අනර මාසික කුලියක්ද අයකර ගෙන නොතිබීම. නවද අදාළ ආයතනය විසින් 2018 සිට 2023 නොවැම්බර් දක්වා භාවිත කර තිබුණු වීදුලිය වෙනුවෙන් දෙපාර්තමේන්තුව ගණනය කර තිබුණු රු.7,571,445ක මුදල් වියුලි පරිභෝජන ගාස්තුව හෝ අයකර ගැනීමට සම්මාලෝචිත වර්ෂය අවසානය දක්වාම නොහැකිව තිබීම.

(උ) ගැසට්පත්‍ර සාමික ප්‍රයුර්වේද රෝහලේ පවත්වා ගෙන යන වෙළඳසැලේ පරීක්ෂා කර තක්සේරු කිරීම සඳහා පත්කළ කමිටුවක් විසින් 2020 මාර්තු 14 දින ඉදිරිපත් කළ නිරීක්ෂණ අනුව රෝහලේ ආපනශාලාව සුභ සාධක සංගමය විසින් රු. 41,600ක මාසික කුලියකට භාණ්ඩ ප්‍රද්ගලයකුට පවරා අදාළ කුලිය සංගමය විසින් ලබාගෙන නැතිවිව අනාවරණය වී තිබුණි. 2020 ජූනි 24 දිනැති අංක 02/03 තක්සේරු/2020 දරන අයුර්වේද කොමසාරිස්ගේ ලිපිය මගින් 2020 ජූනි මස දක්වා අයකරගත් කුලි මුදල් ඒජන්ට් ආදායමට බැරකරන ලෙස සුභ සාධක සංගමයට දන්වා තිබුණද එම මුදල් රජයේ අදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) රෝහල් පරිශ්‍රය තුළ පවත්වා ගෙන යන ජාතික පශු සම්පත් මණ්ඩලයේ (NLDB) කිරි ගලෙට් මධ්‍යස්ථානය 2014 වර්ෂයේ සිට පවත්වා ගෙන ගොස් තිබුණි. 2022 ජනවාරි 31 දින එම වෙළඳ කුටියෙන් රු.6,000ක මාසික කුලියක් අයකර ගැනීමට තක්සේරු කර තිබුණද, 2023 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලච්ඡේදයට අදාල රු.72,000ක් ලැබිය යුතු මහ කුලි අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර ජාතික පශු සම්පත් මණ්ඩලය සමග අදාළ කොන්දේසි ඇතුළත් ගිවිසුමකට එළඹීමටද කටයුතු කර නොතිබුණි.

4 නිරසාර සංවර්ධනය

2017 අංක 19 දරන නිරසාර සංවර්ධන පනතේ 3.6, 3.9, 11 හා 11.2 වගන්ති ප්‍රකාරව, ආයතනයේ අරමුණු ප්‍රභාකර ගැනීම උදෙසා සිය සම්පත් කාර්යක්ෂමව මෙහෙයවිය යුතු අතර නිරසර සංවර්ධන අරමුණු ප්‍රභාකර ගැනීම පිණිස ආයතනය විසින් සපුරාගත යුතු ඉලක්කයන් හා එම ඉලක්කයන් යථාර්ථ ගැනීම සඳහා පවතින පරතරයන්ද, ප්‍රගතිය මැන බැලීම සඳහා සුදුසු දර්ශකයන්ද හඳුනාගත යුතුය. නමුත් දෙපාර්තමේන්තුව විසින් එවැනි දර්ශකයන් හඳුනාගෙන අරමුණුවලින් ප්‍රභාකරගත් ප්‍රමාණය හා මැනැවින්ම අවධානය යොමු කළ යුතු විවිධ ක්ෂේත්‍රයන් හඳුනාගෙන නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුව සඳහා කළමනාකරණ දත්ත පද්ධතියක් සකස් කර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද සම්මාලෝචිත වර්ෂයේද අදාළ දත්ත පද්ධතිය ස්ථාපිත කර නොතිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව හා එහි අනුබද්ධ ආයතන, රෝහල්, වෛද්‍ය මධ්‍යස්ථාන ඇතුළු සම්පූර්ණ ආයතන පද්ධතියට අදාළ යාවත්කාලීන කළමනාකරණ තොරතුරු කාර්යක්ෂමව ලබා ගැනීමට අපහසුව සැවැති අතර දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩල පැමිණීම හා පිටවීම සටහන් කිරීමේ පාලනය, කාර්යසාධන පාලනය, වැටුප් පාලනය, අතිකාල වියදම් පාලනය, ප්‍රද්ගලික ලිපිගොනු පාලනය යනාදී පාලනයන් දුර්වල මට්ටමක පැවැති බව නිරීක්ෂණය විය.

(ආ) 2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 2,363ක් වූවද, රදිහව සිටි කාර්ය මණ්ඩලය 1,681ක් වශයෙන් අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 28කට සමාන ප්‍රමාණයක් වූ 658ක් විය. තවද මෙම ප්‍රමාණය තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ ප්‍රමාණය 109ක්ද තාක්ෂණික මට්ටමේ ප්‍රමාණය 33ක්, ද්විතීයික මට්ටමේ ප්‍රමාණය 296ක් හා ප්‍රාථමික මට්ටමේ ප්‍රමාණය 220ක් පැවතීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ හා ආයුර්වේද රෝහල්වල කාර්ය සාධනයට දැඩි බලපෑමක් සිදු වී තිබුණි.

(ඇ) බණ්ඩාරනායක අනුස්මරණ පර්යේෂණ ආයතනය සඳහා එක් එක් විෂය ක්ෂේත්‍රයට අදාළව පර්යේෂණ නිලධාරී තනතුරු 18 ක් හා පර්යේෂණ සහායක තනතුරු 12 ක් අනුමත කරගෙන තිබුණද, ඉන් කිසිවෙකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර එමල් රාජපක්ෂ ආයුර්වේද පර්යේෂණ රෝහලට පර්යේෂණ කාර්යය මණ්ඩලයක් අනුමත කරගෙන නොතිබුණි. මේ අනුව ආයුර්වේද පර්යේෂණ රෝහල් සිහිටුවීමෙන් අපේක්ෂිත කාර්යසාධනයට පහිතකර බලපෑමක් සිදු වී තිබුණි.

(ඈ) ප්‍රධාන කාර්යාලය සතුව නේවාසිකාගාරයක් හා සංචාරක නිවාසයක් නොතිබියදීත් නේවාසිකාගාර හා සංචාරක නිවාස භාරකරු සහ අරක්කැමි යන තනතුරු 02ක් අනුමත කරවාගෙන එම තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කර තිබුණි.

පී.මාසකෝරාල
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පී. මාසකෝරාල
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

04. පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

අංකය	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100%-90%	75%-89%	50%-74%
1	දේශීය / ආයුර්වේද හා පාරම්පරික වෛද්‍ය ක්‍රම මඟින් මහජනයා හට ගුණාත්මක සේවාවන් ලබාදීම.	95	-	-
2	දේශීය හා පාරම්පරික වෛද්‍යක්‍රම සංරක්ෂණය / විධිමත් නියාමනය / ශික්ෂණ හා පර්යේෂණ තුළින් සංවර්ධනය කිරීම.	98	-	-
3	දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයට අවශ්‍ය ඖෂධ ප්‍රමාණවත්ව හා ගුණාත්මකව නිෂ්පාදනය කිරීම හා ක්ෂේත්‍රය තුළින් මෙරට තිරසර සංවර්ධනයට දායකත්වය ලබාදීම.	-	88	-
3.1	වූර්වල හා ආවේනික ඖෂධීය ශාක සංරක්ෂණය හා ව්‍යාප්ති සේවාවන් ප්‍රවර්ධනය කිරීම රෝහල් සඳහා අවශ්‍ය ඖෂධීය අමුද්‍රව්‍ය සම්පාදනය	-	80	-
3.2	ව්‍යාප්ති හා පර්යේෂණ සඳහා දායකත්වය ලබාදීම හා ඖෂධ ශාක පිළිබඳ මහජනතාව/ප්‍රජා කණ්ඩායම් දැනුවත් කිරීම	-	75	-

5. පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුන ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

අංක	ඉලක්කය / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
				0%-49%	50%-74%	75%-100%
1	**නිරෝගී බව සහ යහපැවැත්ම**	1.1 2030 වන විට ලෝකයේ මාතෘ මරණ ආනුපාතිකය සජීවී උපත් 100,000 ට 70 දක්වා අඩු කිරීම.	ළඟා වෙමින් පවතී		70	
		1.2 සියලුම රටවල්වල නවජාත මරණ අනුපාතිකය සජීවී උපත් 1000ට 12 දක්වා සහ අවුරුදු පහට අඩු ළමා මරණ සජීවී උපත් 1000ට අවම වශයෙන් 25 දක්වා අඩු කිරීමේ ඉලක්කය ඇතිව 2030 වන විට අලුත උපන් සහ වයස අවුරුදු පහට අඩු ළමුන්ගේ වළක්වාගත හැකි මරණ තුරන් කිරීම.	ළඟා වෙමින් පවතී		70	

		1.3 2030 වන විට ඒඩ්ස්, ක්ෂය රෝගය, මැලේරියා ඇතුළු නොතකා හැර ඇති සර්ම කලාපීය වසංගත, හෙපටයිටිස්, ජලය මඟින් ඇතිවන රෝග සහ අනෙකුත් බෝවන රෝග තුරන් කිරීම.	ළඟා වෙමින් පවතී			80
		1.4 2030 වන විට බෝ නොවන රෝග නිසා සිදු වන අකල් මරණ, ප්‍රතිකාර මඟින් හා වළක්වා ගැනීමේ ක්‍රම මඟින් තුනෙන් එකකින් අඩු කරගැනීම සහ මානසික සෞඛ්‍යය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම.	ළඟා වෙමින් පවතී			80
		1.5 හානිකර ආකාරයට මද්‍යසාර භාවිතය සහ අන්තරායකාරී ඖෂධ භාවිතය වැළක්වීමේ ක්‍රියාමාර්ග සහ ප්‍රතිකාර ශක්තිමත් කිරීම.	ළඟා වෙමින් පවතී			80
		1.6 2030 වන විට මහාමාර්ගවල සිදු වන අනතුරුවලින් සිදු වන තුවාල වීම් සහ මරණ සංඛ්‍යාව අඩු කිරීම.	ළඟා වෙමින් පවතී		70	
		1.7 2030 වන විට පවුල් සැලසුම් ක්‍රම පිළිබඳ තොරතුරු සහ අධ්‍යාපනය ද ඇතුළත්ව ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍ය සත්කාරක සේවා සඳහා සියලුදෙනාට ම ප්‍රවේශ වීමේ අවස්ථා තහවුරු කිරීම සහ ප්‍රජනන සෞඛ්‍යය ජාතික ක්‍රමෝපායයන්ට සහ වැඩසටහවලට ඇතුළත් කිරීම.	ළඟා වෙමින් පවතී			80
		1.8 මූල්‍යමය අවදානමට පත් වීම සඳහා ආරක්ෂණය ද ඇතුළත්ව ආරක්ෂාකාරී, ඵලදායී, ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩු වියදමකින් ලබා ගත හැකි ඖෂධ එන්නත් හා අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවාවන් සියලුදෙනාටම ලබාගත හැකි වීම ඇතුළුව විශ්වීය මට්ටමින් සෞඛ්‍ය පහසුකම් ලබාගැනීමට හැකි වීම.	ළඟා වෙමින් පවතී	-	-	-
		1.9 2030 වන විට හානිකර රසායනික, වාතය, ජලය සහ පස දූෂණය වීමත්, අපිරිසුදු වීමත් නිසා ඇති වන මරණ සහ රෝගී තත්ත්වයන් සැලකිය යුතු මට්ටමින් අඩු කිරීම.	ළඟා වෙමින් පවතී	40		
02	**සුනිසි මෙහෙවර සහ ආර්ථික වර්ධනය**	2.1 ජාතික තත්ත්වයන්ට අනුකූලව ඒක පුද්ගල ආර්ථික වර්ධනය පවත්වාගෙන යෑම සහ විශේෂයෙන්ම අවම වශයෙන් සංවර්ධනය වී ඇති රටවල් වසරකට අවම වශයෙන් 7% ක දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනයක් පවත්වාගෙන යෑම.	ළඟා වෙමින් පවතී		65	

		2.2 විවිධාංගීකරණය, තාක්ෂණය ඉහළ නැංවීම, සහ නවෝත්පාදනය තුළින් සහ ඉහළ වටිනාකම් එකතු කරන ලද සහ ශ්‍රමය සඳහා වැඩි ඉල්ලුමක් ඇති ක්ෂේත්‍ර පිළිබඳ අවධානය යොමු කිරීම තුළින් ඉහළ මට්ටමේ ආර්ථික නිෂ්පාදිතයක් ලබාගැනීම.	ළඟා වෙමින් පවතී			80
		2.3 ඵලදායී ක්‍රියාකාරකම්වලට, සුනිසි රැකියා අවස්ථාවන්ට, ව්‍යවසායකත්වයට සහ නිර්මාණශීලීභාවයට සහාය දක්වන්නා වූ සංවර්ධනාත්මක දිශානතියකින් යුත් ප්‍රතිපත්තීන් ප්‍රවර්ධනය කිරීම. මූල්‍ය සේවාවන්ට ප්‍රවේශ වීමට අවස්ථාව සලසමින් ක්ෂුද්‍ර, කුඩා පරිමාණ සහ මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායන් පිහිටුවීම සහ සංවර්ධනය කිරීම දිරිගැන්වීම.	ළඟා වෙමින් පවතී			75
		2.4 2030 දී, තිරසර පරිභෝජනය සහ නිෂ්පාදනය පිළිබඳ දස අවුරුදු වැඩසැලැස්මට අනුකූලව, ලෝක නිෂ්පාදනයේ සහ පරිභෝජනයේදී සම්පත් උපයෝජනය කාර්යක්ෂම කිරීම සහ ආර්ථික සංවර්ධනයේදී පරිසරයට හානි සිදුවීම නැවත්වීමට ක්‍රියාමාර්ග ගැනීම ප්‍රගතිශීලී ආකාරයට වර්ධනය කිරීම. මෙහිදී සංවර්ධනය වූ රටවල් පෙරමුණ ගනු ලැබේ.	ළඟා වෙමින් පවතී			80
		2.5 2030 වන විට ආබාධිත පුද්ගලයින් සහ යෞවනයින් ද ඇතුළත්ව සියලුම කාන්තාවන් සහ පිරිමින් සඳහා ඵලදායී සහ සුනිසි රැකියා අවස්ථාවන් ලබාදීම	ළඟා වෙමින් පවතී		65	
		2.6 2030 වන විට අධ්‍යාපනය නොලබන, පුහුණුවක් නොලබන, රැකියාවක් නොමැති යෞවනයින්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමින් අඩු කිරීම.	ළඟා වෙමින් පවතී		60	
		2.7 බලහත්කාරයෙන් ශ්‍රමය ලබාගැනීම තුරන් කිරීම සඳහා වහාම ඵලදායී ක්‍රියාමාර්ග ගැනීම, කාන්තාවන් වහල් සේවයේ යෙදවීම සහ මානව කුට්ටනය අවසන් කිරීම සහ ළමුන් සොල්දාදුවන් වශයෙන් බඳවා ගැනීමද ඇතුළත්ව අතිශය නරක ආකාරයෙන් ළමා ශ්‍රමය යොදා ගැනීම තහනම් කිරීම සහ තුරන් කිරීම සහ 2025 වන විට සියලුම ආකාරයේ ළමා ශ්‍රමය යොදා ගැනීම අවසන් කිරීම.	ළඟා වෙමින් පවතී	50		
		2.8 කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කිරීම. විශේෂයෙන්ම සංක්‍රමණික කාන්තාවන් ඇතුළු සංක්‍රමණිකයින් සහ අවදානම් සහගත රැකියාවල නිරතවූවන් ඇතුළත්ව වැඩකරන සියලුදෙනා සඳහා ආරක්ෂාකාරී සහ ප්‍රවේසම්සහගත සේවා ස්ථාන සහිත පරිසරයන් ප්‍රවර්ධනය කිරීම.	ළඟා වෙමින් පවතී		70	

		2.9 2030 වන විට දේශීය සංස්කෘතිය, නිෂ්පාදනය සහ රැකියා අවස්ථා ප්‍රවර්ධනය කරන්නා වූ තිරසාර සංචාරක කර්මාන්ත පිළිබඳ ප්‍රතිපත්ති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.	ළඟා වෙමින් පවතී			80
		2.10 සියලුදෙනාට බැංකු පහසුකම්, රක්ෂණ සහ මූල්‍ය සේවාවන් ලබාගැනීමට ප්‍රවේශ විය හැකි පරිදි දේශීය මූල්‍ය ආයතනවල ධාරිතාවන් ශක්තිමත් කිරීම.	-	-	-	-

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

ජයග්‍රහණ

1 තිරසාර සංවර්ධන ඉලක්ක වෙත ළඟා වීම සඳහා බාධාවක්ව පැවැති 1961 අංක 31 දරන ආයුර්වේද ආයුර්වේද පනත විධිමත්ව බල ගැන්වීම සඳහා සංශෝධනය කිරීම

2 ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තිය සඳහා දේශීය වෛද්‍ය ප්‍රතිපත්තිය සමපාතව සකස් කිරීම

3 ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ආයතන ව්‍යුහයන් ප්‍රතිසංවිධානය කිරීම

4 බෝවන හා බෝ නොවන රෝගවලට සාර්ථකව මුහුණ දීම සඳහා ප්‍රතිකාර අංශය ක්‍රියාත්මක කිරීම

5 අන්තර්ජාතික රෝග වර්ගීකරණයට අනුව දේශීය වෛද්‍ය ක්‍රමය වෙත පැහිණෙන රෝගීන්ගේ රෝග වර්ගීකරණය සිදු කිරීම

6 අන්තර්ජාතික වශයෙන් දේශීය වෛද්‍ය ක්‍රමය ප්‍රචලිත කිරීම සඳහා සංචාරක සුවතා අංශය සවිබල ගැන්වීම

අභියෝග

1 පවතින අණපනත් සහ වෙනත් නීත්‍යානුකූලසාධකවල බලපෑම

2 විකල්ප වෛද්‍ය ක්‍රම සමඟ කටයුතු කිරීමේදී ඇති වන විවිධ බාධා

3 සම්පත් හිඟතාව සහ දත්ත එක්රැස් කිරීමේ පවතින දුර්වලතා

4 මානව හා භෞතික සම්පත් හිඟය

6. පරිච්ඡේදය

6.1 මානව සම්පත් පැතිකඩ

සේවක සංඛ්‍යා කළමනාකරණය

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු
ජ්‍යෙෂ්ඨ	**735**	602	**109***
තෘතීයික	**37**	4	**33**
ද්විතියික	**555**	262	**293**
ප්‍රාථමික	**1036**	816	**220**

සැ.යු.

1. " * " - ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තනතුරු (CKD) 308ක් අනුමත වී ඇති අතර 2023.09.30 දින වනවිට වෛද්‍ය නිලධාරීන් 284ක් සේවයේ නියුතු වේ. එම තනතුරු සඳහා අලුතින් බඳවා ගැනීම් සිදු කළ නොහැකිය. සේවයෙන් පසු අහෝසි වේ. ඒ අනුව ඒ තනතුරුවල පුරප්පාඩු ජ්‍යෙෂ්ඨ සේවක වර්ගය තුළ පෙන්නුම් කර නොමැත.

2. කළමනාකරණ සහකාර තාක්ෂණික බණ්ඩය යටතේ නිලධාරිනියන් දෙදෙනෙකු (02) සේවය කරනු ලබයි. එම තනතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් අනුමත වී නොමැති බැවින් ඉහත තොරතුරුවලට ඇතුළත් කර නොමැත.

6.2 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යා	වැඩසටහනේ කාලසීමාව	සමස්ත ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)	නිමවුම /ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
ආයතනික ප්‍රසම්පාදන හා සැපයුම් ජාල කළමනාකරණය - ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය	01	2023.03.30	රු.7,000.00	-	දේශීය	ආයතනික ප්‍රසම්පාදන හා සැපයුම් ජාල කළමනාකරණය සම්බන්ධ දැනුම
ප්‍රසම්පාදන ක්‍රියාවලිය සහතික පත්‍ර පාඨමාලාව - ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	01	2023.05.19 - 2023.08.11	රු.25,000.00	-	දේශීය	ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධ දැනුම
ලිපිගොනුකරණය - ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	04	2023.06.20	රු.20,000.00	-	දේශීය	ලිපිගොනුකරණය සම්බන්ධ දැනුම
ගුණාත්මක වැඩ පරිසරයක් සඳහා කාර්යාල කාර්ය සහායකයින් සහ රියදුරන්ගේ වෘත්තීය සංවර්ධනය - ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	06	2023.07.18	රු.30,000.00	-	දේශීය	ගුණාත්මක වැඩ පරිසරයක් සඳහා කාර්යාල කාර්ය සහායකයින් සහ රියදුරන්ගේ වෘත්තීය
කාර්යාල ක්‍රම - ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	10	2023.07.19 – 2023.07.20	100,000.00	-	දේශීය	කාර්යාල ක්‍රම සම්බන්ධ දැනුම
හානි පාඩු හා මු.රෙ. 104 යටතේ වූ පරීක්ෂණය - ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	05	2023.07.27	රු.25,000.00	-	දේශීය	හානි පාඩු හා මු.රෙ. 104 යටතේ වූ පරීක්ෂණය සම්බන්ධ දැනුම
ප්‍රසම්පාදනය පිළිබඳ දෙදින වැඩමුළුව - ශ්‍රී ලංකා පදනම් ආයතනය	06	2023.09.19 – 2023.09.20	රු.84,000.00	-	දේශීය	ප්‍රසම්පාදනය සම්බන්ධ දැනුම

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)	නිමවුම /ලබාගත් දැනුම
			දේශීය රු.	විදේශීය		
ප්‍රසම්පාදනය පිළිබඳ දෙදින වැඩමුළුව - ශ්‍රී ලංකා පදනම් ආයතනය	04	2023.10.11 – 2023.10.12	56,000.00	-	දේශීය	ප්‍රසම්පාදනය සම්බන්ධ දැනුම
ප්‍රසම්පාදනය පිළිබඳ දෙදින වැඩමුළුව - ශ්‍රී ලංකා පදනම් ආයතනය	38	2023.11.08 - 2023.11.09	532,000.00	-	දේශීය	ප්‍රසම්පාදනය සම්බන්ධ දැනුම
අමාත්‍ය මණ්ඩල සංදේශ පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම- Skills Development Fund Ltd	09	2023.12.15	54,000.00	-	දේශීය	අමාත්‍ය මණ්ඩල සංදේශ පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධ දැනුම
මූලික විමර්ශන පුහුණුව - Skills Development Fund Ltd	03	2023.12.19 - 2023.12.20	28,500.00	-	දේශීය	මූලික විමර්ශන පුහුණුව සම්බන්ධ දැනුම
ආයතන සංග්‍රහයේ විධි විධාන හා පටිපාටික රීති භාවිතය - Skills Development Fund Ltd	06	2023.12.21 - 2023.12.22	57,000.00	-	දේශීය	ආයතන සංග්‍රහයේ විධි විධාන හා පටිපාටික රීති භාවිතය සම්බන්ධ දැනුම
කාර්යාල කාර්ය සහායකයින් සහ රියදුරන්ගේ ආකල්ප හා වෘත්තීය දැනුම ඉහළ නැංවීම - Skills Development Fund Ltd	04	2023.12.21 - 2023.12.22	38,000.00	-	දේශීය	කාර්යාල කාර්ය සහයකයින් සහ රියදුරන්ගේ ආකල්ප හා වෘත්තීය දැනුම ඉහල නැංවීම සම්බන්ධ දැනුම

7.පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී මඟ හරවා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ,
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම.	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.6	වෙනත්	අදාළ නොවේ		
2	**පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී මඟ හරවා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම.	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම.	අනුකූල වේ		
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම.	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රෙල්ඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිත කිරීමේදී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NDB) නියමිත දිනට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
5	**විගණන විමසුම**			

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී මහ හරවා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ 134(2) DMA/1 – 2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම.	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව. සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම.	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදි ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම.	අනුකූල වේ		

අංක	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී මඟ හරවා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්ථා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකර තිබීම.	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම.	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම.	අනුකූල නොවේ	ප්‍රායෝගික ගැටලු	දෙපාර්තමේන්තුව මඟින් සිදු කිරීම
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කරගෙන පවත්වාගෙන යාම.	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම් නැවත පරීක්ෂා කිරීම.	අනුකූල වේ		
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහනවල ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී මඟ හරවා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිවැරදි කර තිබීම.	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ		
11.2	මු.රෙ 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළැඹීම.	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම.	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවැත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල්කර තිබීම.	අනුකූල වේ		
13	පොදු තැන්පත් ගිණුම			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතුකර තිබීම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට පේෂණයකර තිබීම.	අනුකූල වේ		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්යය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල්කර තිබීම.	අනුකූල වේ		
14.3	මු.රෙ 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත්කර තිබීම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී මඟ හරවා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකර තිබීම.	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකර සෘජුවම ආදායමට බැර කරතිබීම.	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්යමණ්ඩල සීමාව තුළ කාර්යමණ්ඩලය පවත්වාගෙන යාම.	අනුකූල වේ		
16.2	කාර්යමණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම.	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියකු පත්කර තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පළ කිරීමට අවස්ථාව සලසා තිබීම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී මඟ හරවා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනයකර ක්‍රියාත්මකකර තිබීම.	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදයේ පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස්කර තිබීම.	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස්කර තිබීම.	අනුකූල වේ		
19.2	කාර්යමණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12ට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරුකර තිබීම.	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්යමණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන්කර තිබීම.	අනුකූල නොවේ	පවතින මානව හෞතික සම්පත් අනුව මෙම කටයුතු නිවැරැදිව ක්‍රියාත්මක කළ නොහැකිය.	ඉදිරියේදී අවශ්‍ය මානව හා හෞතික සම්පත් ලැබීම අනුව කටයුතු කරනු ලැබේ.

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී මඟ හරවා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
19.4	ඉහත සඳහන් චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කර තිබීම.	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදිකර තිබීම.	අනුකූල වේ		